# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,613 — 1966 ජනවාරි 7 වැනි සිකුරාදා — 1966.1.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් කාණ්ඩයට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දන්වීම් ... ... | 1 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දන්වීම් ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | 2 | | |

## වෙළෙඳ ලකුණු පිළිබඳ දන්වීම්

### වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇෂලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුය.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

ආණ්ඩුවේ නිවාඩු දිනයන් හැරුණු විට සතියේ සෙනසුරාදා හැර සෑම දිනකම දහයේ සිට හතර දක්වාද, සෙනසුරාදා දිනවල දහයේ සිට එක දක්වාද ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර සතියේ දිනවල සවස 3 දක්වා ද, සෙනසුරාදා දිනවල දවල් 12 දක්වාද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් නාමොපාදානයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥාපනතේ 33 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිවම කාර්යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

### විශේෂ නිවේදනයකි

1966 ජනවාරි 20 වැනි බ්‍රහස්පතින්දා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1966 ජනවාරි 21 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දන්වීම් සහ නිවේදන, 1966 ජනවාරි 16 වැනි ඉරිදා ප. ව. 3.30 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනයකරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජනවාරි 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

1——බී 68436—5,463 (65/12)

## විරෝධතා දැන්වීම

පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෙත් ලාංඡන මුද්දරයක්ද සමග ටී. ඇම්. 7 දරන පෝරමය මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබනොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින කැනැත්තාට තම ඉල්ලීම අත්හැර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළිගෙල කිරීමේ වියදම් දැරීමට පෙර සැහෙන පූර්වාංශ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා සිය විධිමත් විරෝධතාවක් ඉදිරිපත් කො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් කො කල්හොත් එසේ විරුද්ධ වන්නා විසින් ගන්නා අයකර ගැනීමට වියදම් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේ දී මෙම කී පෙරිදි දැන්වීමක් යැවීමේ කාර්යය සැලැර පැර නීතිය ද සැලකිල්ලට ගනු ලැබේ.

---

## පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 ජනවාරි 29 වැනි දින දරන අංක 5369

MAURICE GERARD DE SAN

" පැසවෙන තේ කොළ පිරියම් කිරීමේ ක්‍රියාවලිය සහ ඊට අවශ්‍ය උපකරණ. "

සංක්ෂේපය.—පැසවීමේ ක්‍රියාව සිදුවෙමින් පවතින (කහට පිපිගෙන එන) තේකොළ පිරියම් කිරීමේ ක්‍රියාවලිය ද ඊට අවශ්‍ය උපකරණ ද මෙහි විස්තර කරනු ලැබේ. ක්‍රියාවලිය මෙසේ ලාක්ෂණික වේ. පැසවෙන තේ කොළ හුමාලය සමඟ ගැටෙන්ට සැලැස්වීමෙන් සෙ. 100°ක උෂ්ණත්වයකට ශීඝ්‍රයෙන් නංවනු ලැබේ. සුදුසු පරිදි පිළියෙළ කළ මාවර සෝරු මගින් වරෙක පහළ සිට උඩට ද වරෙක උඩ සිට පහළට ද යනාදි වශයෙන් මාරු වෙන් මාරුවට තේ කොළ තට්ටුවක් තුළින් හුමාලය යැවීම සිදු කෙරේ. උපකරණයේ අත්‍යවශ්‍ය කොටස් නම් හුමාල ජනකයකුත් සවිල ආධාර කයකුත් කොන්වෙන්සරයකුත් වේ. තේ කොළ තැන්පත් කිරීම සඳහා මෙ ආධාරකය පිළියෙළ කොට ඇත්තේ ය. එක් කෙළවරකින් හුමාලය ඇතුළු කරනු ලබන්නා වූ ද අනෙක් කෙළවරින් හුමාලය ඉවතට ගනු ලබන්නා වූ ද භාජනයක් තුළින් මේ කොළ යවනු ලැබේ. කොළවල නැවුණු පසු හුමාලය ඝනීභවනය වෙයි. තේවල ඇති වාෂ්පශීලී තෙල් එමගින් එකතු කරගනු ලැබේ.

හිමිකම් ප්‍රකාශ 10ක් ද රූ සටහන් පතක් ද මීට ඇතුළත් ය.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1965 සැප්තැම්බර් 6 වැනි දින,
කොළඹ දී ය.

1–21/1

---

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 පෙබරවාරි 19 වැනි දින දරන අංක 5382 (63.7.27 දින පූර්වතාවට හිමිකම් පාන රුමේනියාවේ අංක 46713 දරන සම්මුති ඉල්ලුම් පත්‍රය)

MINISTERUL INDUSTRIEI PETROLULUI SI CHIMIEI

" නැප්තා කැකෑරුම් පරාස හයිඩ්රොකාබන වරණීය පරිවර්තනයට පත් කරන ක්‍රමය "

සංක්ෂේපය .—මෙම නව නිර්මානයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කරගත හැකි වේ :—

1. නැප්තා හයිඩ්රොකාබනවල වරණීය පරිවර්තන ක්‍රමයකට ලාක්ෂණික වූ කරුණ මෙසේ ය. වැඩි වශයෙන් ම හයිඩ්රොකාබන් අන්තර්ගත වූ නැප්තලින්වලින් ද නැප්තා කැකෑරුම් පරාසයේ පැරපින ශ්‍රේණියෙන් ද යුක්ත වඩිය, පරිවර්තනයට පෙර භාගික ආසවනයට ලක් කරනු ලැබේ. මෙහි දී කාබන් පරමාණු 5ක් තෙක් ඇතුළත් සැහැල්ලු හයිඩ්රොකාබන වලින් යුක්ත වූ මුල් භාගයකුත් කාබන් පරමාණු 6ටත් 8ටත් අතර ගණනක් ඇතුළත් හයිඩ්රොකාබනවලින් යුක්ත වූ මැද භාගයකුත් කාබන් පරමාණු 10කට වැඩි ගණනක් ඇතුළත් හයිඩ්රොකාබන්වලින් යුක්ත වූ අවසාන භාගයකුත් හටගනී. අධික ඇරෝමැටික ප්‍රමාණයක් ඇත්තා වූ නිෂ්පාදන සහ උච්ච ඔක්ටේන් ඉන්ධන ලබා ගැනීම සඳහා තාපය යෙදීමෙන් ද, උත්ප්‍රේරක යෙදීමෙන් ද පරිවර්තනය, හයිඩ්රජනීකරණය, සහ ශුද්ධ කිරීම යන මේ ක්‍රියාවලට යථෝක්ත භාග තුන වෙන වෙන ම පත් කරනු ලැබේ.

හිමිකම් ප්‍රකාශ 4ක් ද රූ සටහන් පතක් ද මෙහි ඇතුළත් වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර් 20 වැනි දින,
කොළඹ දී ය.

1–21/2

---

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 පෙබරවාරි 19 වැනි දින දරන අංක 5385 (අංක PV 8,30,938 දරන ප්‍රංශ ඉල්ලුම් පතේ 63.4.9 පූර්වතා දිනයට හිමිකම් පාන සම්මුති ඉල්ලුම් පත්‍රය)

SOCIETE INDUSTRIELLE ET COMMERCIALE DES SALINS DU MIDI

" අපද්‍රව්‍ය ඇතුළත් වන ස්ඵටිකරූපී ද්‍රව්‍ය කාර්මික ලෙස ශුද්ධ කිරීමේත් ඡේදීමේත් ක්‍රියාවලිය. "

සංක්ෂේපය .—මෙම නව නිර්මානයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කර ගත හැකි ය :—

1. ඛනිජ තට්ටුවලින් හෝ වාෂ්පීකරණ පද්ධතිවලින් හෝ නිකුත් වන ස්ඵටිකරූපී ද්‍රව්‍ය කාර්මික ලෙස ශුද්ධ කිරීමේත් ඡේදීමේත් ක්‍රියාවලියකි. එකී ක්‍රියාවලිය මෙසේ සමන්විත වේ.

(*a*) පළමු වැනි අවස්ථාව : වාෂ්පීකරණ පද්ධතිවල ස්ඵටිකරූපී ද්‍රව්‍ය ද ඒවා සමඟ ඇති මව් ද්‍රව ද කේන්ද්‍රාපසාරී වෙන් කිරීමකට භාජන කිරීම. අද්‍රාව්‍ය දූයින් එක් කොටසක් ද අවලම්බිත තත්ත්වයේ ඇති ස්වල්ප වශයෙන් දියවෙන යම් යම් අපද්‍රව්‍ය ද හටගන්නා කරදියත් සමඟ එකී කේන්ද්‍රාපසාරී වෙන් කිරීමේ දී ඉවත් කැරේ ;

(*b*) දෙ වැනි අවස්ථාව: පළමු වැනි අවස්ථාවෙන් ලත් ඵලය දිය වන්නේ නැති ද්‍රවයක් සමඟ මිශ්‍ර කර ඒ මිශ්‍රණයට සයික්ලෝන් දර්ශයේ වෙන්කුරුවක් වැනි ඝනකර වෙන්කුරුවක් පිට පිට ම යොදා අනතුරුව කේන්ද්‍රාපසාරී වෙන් කිරීමකට ලක් කිරීම. මේ ක්‍රියා දෙකෙන් පළමු වැන්නේ දී ද්‍රවයෙන් එක් කොටසකුත් සමඟ සෙසු අද්‍රාව්‍ය කොටසද අවලම්බිත තත්ත්වයේ ඇති අපද්‍රව්‍ය ද සම්පූර්ණයෙන් ම වාගේ ඉවත් කෙරේ. දෙ වැනි ක්‍රියා වේ දී අද්‍රාව්‍ය කොටස් ද අවලම්බිත තත්ත්වයේ ඇති අපද්‍රව්‍ය ද ඉතිරි ද්‍රවයත් සමඟ සහමුලින් ම ඉවත් කෙරේ.

හිමිකම් ප්‍රකාශ 11ක් ද රූ සටහන් පත් 2ක් ද මෙහි තිබේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර් 20 වැනි දින,
කොළඹ දී ය.

1–21/3

## දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 අප්‍රේල් 3 වැනි දින දරන අංක 5403 (63.4.22 දින පූර්වතාවට හිමිකම් පාන ඇමෙරිකා එක්සත් ජනපදයේ අංක 2,74,420 දරන සම්මුති ඉල්ලුම් පත්‍රය)

ALUMINIUM LABORATORIES LIMITED

" විලීන කළ ලවණ මිශ්‍රණවල සංයුතිය නිර්ණය කරන ක්‍රමය "

**සංක්ෂේපය.**—මෙම නව නිර්මානයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කර ගත හැකි ය :—

1. ක්ෂාර ලෝහ ලවණයකුත් විද්‍යුත්-සෘණතාව අඩු ලෝහයක ලවණය කුත් ඇතුළත් වන ද්‍රව වුණු ලවණ මිශ්‍රණයක සංයුතිය මනින ක්‍රමයකි. ක්‍රමය මෙසේ ය : පළමු වැනි ඉලෙක්ට්‍රෝඩයකටත් වීදුරු පටලයක එක් පැත්ත කටත් අතරින් එකී මිශ්‍රණය තබනු ලැබේ. වීදුරු පටලය හරහා එකී ක්ෂාර ලෝහයේ අයන පරිවහනය කෙරෙන්නට පුළුවන් බැවින් වීදුරු පටලයේ අනෙක් පැත්තත් සමඟ දෙ වැනි ඉලෙක්ට්‍රෝඩයකට විද්‍යුත් සම්බන්ධතාව පවත්වා ගැනීමට සැලැස් වේ. දනගත් උෂ්ණත්වයක දී එකී ඉලෙක්ට්‍රෝඩ දෙක අතර විභවය මැන ගෙන එම විභවය, එකී දනගත් උෂ්ණත්වයේ දී දන්නා සමානුපාතවලින් එකී ලවණ දෙක මිශ්‍ර කර තැනූ මිශ්‍රණවලින් ලත් විභව මැනීමෙන් පිළියෙළ කර ගත් ක්‍රමාංකන වක්‍රයක් සමඟ සසඳනු ලැබේ.

හිමිකම් ප්‍රකාශ 16ක් ද රූ සටහන් පත් 2ක් ද මෙහි තිබේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර් 20 වැනි දින,
කොළඹ දී ය.

1-21/4

---

## දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 අප්‍රේල් 3 වැනි දින දරන අංක 5404 (63.4.24 දින පූර්වතාවට හිමිකම් පාන ඇමෙරිකා එක්සත් ජනපදයේ අංක 2,75,366 දරන සම්මුති ඉල්ලුම් පත්‍රය)

ALUMINIUM LABORATORIES LIMITED

" ඇලුමිනියම් ලබා ගැනීම සඳහා වූ සබහේලයිඩ ආසවන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම නොහොත් ඊට අදල දියුණු කිරීම් "

**සංක්ෂේපය.**—මෙම නව නිර්මානයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කර ගත හැකි ය :—

1. ඇලුමිනියම් අන්තර්ගත ලෝහයෙන් ඇලුමිනියම් බේරා වෙන් කර ගන්නා ක්‍රමයකි. සෙ. 1000 කට ඉහළ උෂ්ණත්වයක දී එකී ඇලුමිනියම් අන්තර්ගත ලෝහයට ඇලුමිනියම් ට්‍රයිහේලයිඩ ධාරාවක් යවනු ලැබේ. මෙය කරන්නේ වායුමය ඇලුමිනියම් මොනොහේලයිඩ ජනනය කැරවීම පිණිස ය. සිසිල් කිරීමෙන් මෙය වියෝජනය කර ඇලුමිනියම් ලෝහය උපයා ගනු ලැබේ. මෙම වියෝජන ක්‍රියාවලිය මෙසේ ලාක්ෂණික වේ. ද්‍රව වුණු ඇලුමිනියම් වලට ද ඇලුමිනියම් මොනොහේලයිඩ අන්තර්ගත වායු ධාරාවට ද සාපේක්ෂ ව සලකන කළ නිෂ්ක්‍රිය ස්වභාවයක් උසුලන ඝන අංශුවලින් සැදි තරලීකෘත සිසිල් තට්ටුවක් තුළ සිසිල් කිරීමෙන් වායුමය ඇලුමිනියම් මොනොහේලයිඩ ය වියෝජනය කරනු ලැබේ.

හිමිකම් ප්‍රකාශ 8ක් ද රූ සටහන් පතක් ද මෙහි තිබේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර් 20 වැනි දින,
කොළඹ දී ය.

1-21/5

---

## දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 ජූනි 17 වැනි දින දරන අංක 5464

TOYO RAYON KABUSHIKI KAISHA

" රේඛීය එතිලීන් ටෙරිප්තැලේට් පොලිඑස්ටර නිෂ්පාදනය "

**සංක්ෂේපය.**—මෙම නව නිර්මානයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කර ගත හැකි ය :—

1. ටෙරිප්තැලික් අම්ලය හෝ ඩයි-පහළ ඇල්කිල් ටෙරිප්තැලේට් සහ එතිලින් ග්ලයිකොල් හෝ ද ඒ සමඟ සහසංඝනනය විය හැකි වෙන යම් අම්ල අවයව සහ/හෝ ග්ලයිකොල් අවයව ද ගෙන රේඛීය එතිලීන් ටෙරිප්තැලේට පොලිඑස්ටර නිෂ්පාදනය කරන ක්‍රියාවලියකි. එකී පොලි එස්ටරවල අම්ල අවයවයෙන් අඩු ගණනේ අණුක ප්‍රතිශත 80ක ප්‍රමාණයක් වත් ටෙරිපාලොයිල් කාණ්ඩවලින් ද ග්ලයිකොල් අවයවයෙන් අඩු ගණනේ අණුක ප්‍රතිශත 80ක ප්‍රමාණයක් වත් එතිලීන් බයිසොක්සි කාණ්ඩවලින් ද යුක්ත වන්නේ ය. මෙහි ලක්ෂණය නම් එකී ක්‍රියාවලියෙන් යටත් පිරිසෙයින් බහුසංඝනන අවස්ථාව වත් සිදු කෙරෙනුයේ එක්කෝ ටයිටේනියම් ක්ලෝරයිඩ නැතිනම් ඇමෝනියම් ඔතොටයිටනේට්, නො එසේ නම් ඇමෝනියම් මෙටාටයිටනේට් උත්ප්‍රේරක ප්‍රමාණයක් තිබෙන විට දී ය.

හිමිකම් ප්‍රකාශ 3ක් ද නිදසුන් 6ක් ද මෙහි තිබේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර් 20 වැනි දින,
කොළඹ දී ය.

1-21/6

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම** යෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(හැම සිකුරාදා දිනයක්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනී ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. එසිප් ගෙන එවනවා නම් වඩාත් හොඳයි.

7. හැම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. ලංකාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ රෙජිස්ට්‍රාර් මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | 10 | 0 |
| වැඩිවන හැම අඟලට හෝ ඉන් කොටසකට | ... | ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | 220 | 0 |

අඟලේ හැම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. හැම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන හැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | | | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... | ... | ... | 27 50 | ... | 40 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් | ... | ... | 17 50 | ... | 23 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | ... | ... | 25 0 | ... | 33 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිල රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... | ... | 0 30 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... | ... | 0 60 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... | ... | 0 15 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... | ... | 0 30 | ... | 0 15 |

දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.